ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය
දුරකථනය: +94(11)249-8100 - ෆැක්ස්: +94(11) 244-9070
ඉ-තැපැල්: shenjy@state.gov - වෙබ් අඩවිය: http://srilanka.usembassy.gov

නිවේදන අංකය: 20140904

නව එක්සත් ජනපද සංක්‍රමණ-නොවන වීසා අයදුම්පත් ක්‍රමය

2014 සැප්තැම්බර් 4: කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය 2014 සැප්තැම්බර් 7 සිට නව විද්‍යුත් මාර්ගගත සංක්‍රමණ-නොවන වීසා අයදුම්පත් සේවාවකට හුවමාරු කෙරේ. නව සැකසුම වඩා පහසු සහ භාවිත-හිතවත් ලෙස නිර්මාණය කර ඇති ලොව පුරා එක්සත් ජනපද තානාපති කාර්යාලයන්හි භාවිතා කෙරෙන්නකි.

තවද, ඇමතුම් මධ්‍යස්ථාන නියෝජිතයින් විසින් දුරකථන අංකය +94-11-7703703 වෙතින් නොමිලේ වීසා තොරතුරු ලබා ගැනීමට හැකි පැය ගනන තවදුරටත් පුළුල් කරනු ඇත. මෙම නියෝජිතයින් 2014 සැප්තැම්බර් 8 සිට සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 8:00 සිට ප.ව.8:00 දක්වා කටයුතු කරනු ඇත.

මෙම වෙනස් කිරීම, නව වීසා සම්මුඛ සාකච්ඡා සඳහා දින සහ වේලා වෙන් කිරීම වෙබ් අඩවියට සබඳතාවයක් මෙන්ම සාමාන්‍ය වීසා තොරතුරු, තානාපති කාර්යාලීය වෙබ් අඩවිය http://srilanka.usembassy.govහි සඳහන්ය. වෙබ් අඩවිය සහ ඇමතුම් මධ්‍යස්ථාන සේවා ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් සැපයේ.

නව සංක්‍රමණ-නොවන වීසා අයදුම්පත් ක්‍රමය

1. ඔබේ වීසා අයදුම්පත (DS-160) http://ceac.gov/genniv හි සම්පූර්ණ කරන්න.
2. 2014 සැප්තැම්බර් 7 සිට අපගේ නව වීසා සම්මුඛ සාකච්ඡා සඳහා දින සහ වේලා වෙන් කිරීම වෙබ් අඩවිය www.ustraveldocs.com/lk වෙත පිවිස ගිණුමක් සැකසීම සහ *බැංකු තැන්පතු පත්‍රිකාව මුද්‍රණය කල හැක.*

3. අවශ්‍ය අයදුම්පත් ගාස්තුව ගෙවීමට බැංකු තැන්පතු පත්‍රිකාව දේශීය DFCC බැංකු ශාඛාවකට රැගෙන යන්න.
4. ගාස්තුව ගෙවීමෙන් පසු, එය පද්ධතියට ඇතුළුවන තෙක් වැඩ කරන දිනක් හෝ දෙකක් බලා සිටින්න.
5. වීසා සම්මුඛ සාකච්ඡා සඳහා දින සහ වේලා වෙන් කිරීම වෙබ් අඩවිය www.ustraveldocs.com/lk වෙත පිවිස ඔබේ බැංකු ලදුපතේ ගෙවීම් අංකය භාවිතා කර ඔබේ වීසා සම්මුඛ සාකච්ඡාව සඳහා දිනය සහ වේලාව වෙන් කරගන්න.
6. අවශ්‍ය ලියකියවිලි සමග ඔබ වෙන් කරගත් වේලාවට තානාපති කාර්යාලයට එන්න.
7. ඔබේ වීසා අනුමත වුවහොත්, තානාපති කාර්යාලයෙන් එය ලබා ගැනීමට දිනයක් සහ වේලාවක් දැනුම් දෙනු ඇත.

තානාපති කාර්යාලීය වෙබ් අඩවිය සහ ඇමතුම් මධ්‍යස්ථානය සාමාන්‍ය වීසා තොරතුරු සඳහා ඇති එකම නිල මූලාශ්‍රය මෙන්ම පුද්ගලික වීසා සම්මුඛ සාකච්ඡාවක් ලබාගැනීමට ඇති එකම බලලත් ක්‍රමයයි. පැරණි ක්‍රමය මගින් වීසා සම්මුඛ සාකච්ඡාවක් ලබා ගෙන ගෙවීම් සිදුකර ඇති අයදුම් කරුවන් එම පෙර ක්‍රමය අනුව කටයුතු කල යුතුය.